# අපේ රටේ කාන්තා නියෝජනය ප්‍රමාණවත් නෑ

**මැතිවරණ ක්‍රියාවලිය ආශ්‍රිතව මතු වන කරුණු ගැන කෙරෙන සංවාදයකි.**

**ප්‍රශ්නය:- මහ මැතිවරණයේ ප්‍රචාරක ව්‍යාපාරය දැන් සෑහෙන තරම් මෝරා ගොස් තිබෙනවා. පෝස්ටර්, බැනර් හා කටවුට්වලින් තොරව ඔබ ගෙන යන ඡන්ද ප්‍රචාරක ව්‍යාපාරයට ලැබෙන ජනතා ප්‍රතිචාරය කෙබඳු ද?**

**පිළිතුර:-** ඉතාම හොඳයි. මා කරන්නේ කුඩා සාකච්ඡා සහ වතු රැස්වීම් ආදිය තබමින් ජනතාවගේ ප්‍රශ්න ගැන සමීපව අවධානය දැක්වීමයි. පවත්නා සාම්ප්‍රදායික මැතිවරණ ක්‍රමයෙන් ඔබ්බට ගිය දුෂ්කර වැඩක් මේක. අප මේ වන විට සෑම නිවසකටම වගේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය බෙදා හැර තිබෙනවා. සමාජයේ සෑම ජන කොටසක් සමගම මා හොඳ අදහස් හුවමාරුවක් කරමින් වත්මන් රජයේ ප්‍රතිපත්ති ගැන ජනතාව දැනුම්වත් කරනව. අවධානය අඩු කොටස් කෙරේ අපේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය වැඩි උනන්දුවක් දක්වනව.

**ප්‍රශ්නය:- ඔබේ නිගමනයේ හැටියට මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ අවධානය අඩු කොටස ලෙස හඳුනා ගැනෙන්නේ කව් ද?**

**පිළිතුර:-** මා හිතන්නෙ කාන්තා පක්ෂය. කාන්තා නියෝජනය අඩුයි. ඉන්දියාව ගත්තම දේශපාලන ක්ෂේත්‍රයේ 1/3ක් පමණ කාන්තාවන්ට ඉඩ දෙන්න තීරණය වෙලා තිබෙනව. අපේ ප්‍රාදේශීය සභා වගේ එහේ තිබෙන පංචායත් සභාවල 50%ක් කාන්තාවන්ට ඉඩ දෙන්න තීරණයක් ගත්ත. නමුත් අපේ රටේ කාන්තා නියෝජනය ප්‍රමාණවත් නැහැ.

**ප්‍රශ්නය:- ලෝකයේ ප්‍රථම අගමැතිනිය මෙන්ම ජනාධිපතිනිය ද බිහි කළ රටක් ශ්‍රී ලංකාව. ඉතින් එවන් රටක දේශපාලනයේ කාන්තාවන්ට ඉඩ මදිය කීම පිළිගත හැකි ද?**

**පිළිතුර:-** රාජ්‍ය නායක නායිකාවන් බිහි කිරීම හරි. නමුත් අපේ කාන්තාවන් තමයි දැන් රටේ ආර්ථිකයේ කොඳු නාරටිය. ඇඟලුම් කර්මාන්තය, වතුකරය, විදේශ රැකියා වැනි රටේ ප්‍රධානම ආදායම් මාර්ග සමග බැඳී සිටින්නේ කාන්තාවන්. ඉතින් රටේ ආර්ථිකයේ මේ තරම් බරක් දරන කාන්තාවන්ට සාධාරණ පාර්ලිමේන්තු නියෝජනයක් ලැබී නැහැ. අනික රටේ බොහෝ ක්ෂේත්‍රවල උගත් කාන්තාවෝ ඉන්නවා. දැන් නීති විද්‍යාලෙ ඉන්න ළමයින්ගෙන් 60%ක් ම කාන්තාවො. ලෝක සමාජයත් මේ තත්ත්වයන් තේරුම් ගෙන ඊට ගැලපෙන ලෙස හැඩ ගැසෙනවා. අපත් ඒ අනුව ක්‍රියා කළොත් මීට වඩා යහපත් අනාගතයක් රටට උදා කරගන්නට පුළුවන් බවයි මගේ අදහස.

**ප්‍රශ්නය:- ඔබ නිතර කියනව මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කළ යුතු බව. මොනව ද කළ යුතු වෙනස්කම්?**

**පිළිතුර:-** ජනතාවගේ පැත්තෙන් ගත්තොත් ඒ අය නිතර නිතර කියනව මොන ආණ්ඩුව ආවත් තමන්ට යුක්තිය හා සාධාරණය පවතින ක්‍රමය තුළින් ඉෂ්ට වන්නේ නැහැ කියල. මම අධිකරණ ඇමැති වුණාමත් මේ ගැන හොයල බලා තිබෙනවා. ජනතාවගෙ පැමිණිලි ඉදිරිපත් කරන්න වෙනම ක්‍රමයකුත් මම හැදුවා. යුක්තිය ඉටු වීම වගේම ඒක පෙනෙන්නත් තිබිය යුතු යයි පිළිගැනීමක් තිබෙනව. ඒ නිසා අපි ජනතාවගේ සැබෑ ප්‍රශ්න තෝරාගෙන ඒවා සඳහා කල් පවතින විසඳුම් දිය යුතුයි.

**ප්‍රශ්නය:- දේශපාලනඥයින් කරන්නේ ජනතා මෙහෙවරත් බොහෝ දෙනා විවිධ සමාජ සේවා සමාජ සත්කාර කරමින් ජනතාවගේ ප්‍රශ්න විසඳන්න හදනව නේද?**

**පිළිතුර:-** ජනතාවට නොමිලේ යමක් බෙදා දීලා රටේ ප්‍රශ්න විසඳන්න බැහැ. ඉස්සර ආණ්ඩුවලින් නොමිලේ හාල් දුන්නා. ඒත් දුප්පත්කම අඩු වුණේ නැහැනේ. ඒ නිසා අප කළ යුත්තේ ප්‍රශ්නලට බලපාන හේතු සොයා ඒවා හඳුනා ගෙන ඊට පිළියම් කිරීමයි. මම කවදාවත් නොයෙක් දේ බෙදා දීලා ඡන්දය ඉල්ලන්නෙ නැහැ. මේක පවතින ක්‍රමය තුළ කරන්න අමාරු වැඩක්. ඡන්ද ප්‍රචාරක ව්‍යාපාරය තුළ පෝස්ටර් කටවුට් නැති වුණාට ජනතාවාදී දේශපාලනය නව සමාජයේ රිජිස්ටර් වෙන්න පුළුවනි.

**ප්‍රශ්නය:- යුද්ධය අවසන් වීමෙන් පසු මේ ගෙවී යන්නේ පරිවර්තන යුගයක් යයි ඔබ කියනව. මොකක් ද ඔබ දකින පරිවර්තනය?**

**පිළිතුර:** ඔව්. මේක පරිවර්තන යුගයක් තමයි. අපි අලුත් යුගයකට පිවිසෙන්න කාලය හරි. අපේ ප්‍රජාතන්ත්‍රවාදය, නීති ක්‍රම, අධ්‍යාපනය, සෞඛ්‍යය වගේ ක්ෂේත්‍රවල බොහෝ වෙනස්කම් සිදු විය යුතු යැයි මා හිතනව. මේ වෙනස ඔස්සේ පොදු ජනතාවට, කාන්තා පක්ෂයට, තරුණයන්ට තමන්ගේ බලාපොරොත්තු සඵල කරන්න්නට අවකාශ තිබිය යුතු බව. නැත්නම් 1971 වගේ 1987 වගේ විප්ලවයකට අපට මුහුණ දෙන්නට වේවි. ඒ එන විප්ලවය 1971-87ට වඩා දරුණු වෙන්නත් ඉඩ තිබෙනව. ඒ නිසා කොටි ත්‍රස්තවාදය හමාරවූ පසු පොදු ජනතාවගේ අපේක්ෂා වැඩිපුර ඉටු වන පාලන ක්‍රමයක් ඇති කරන්න අපි ආණ්ඩුවක් හැටියට මහන්සි වෙන්න ඕනෑ.

**ප්‍රශ්නය:- ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ දෙවැනි ධුර කාලයේ ඔහු විසින් නිර්මාණය කරනු ලබන පාර්ලිමේන්තුවට මේ වෙනස කරන්නට ශක්තිය තිබේ ද?**

**පිළිතුර:-** ඒ සඳහා ජනාධිපතිතුමාට ශක්තිය තිබෙනව. අපේ සමගිය අප තබා ගැනීම ඉතා වැදගත්. පාර්ලිමේන්තුව හරහා ජනාධිපතිතුමාගේ අරමුණු සාර්ථක කරගන්න අපට උදව් විය හැකියි.

**ප්‍රශ්නය:- රජය තුළ විවිධ පක්ෂ කණ්ඩායම් රැසක් ඉන්නවා. ඒ අය විවිධාකාරයේ තමන්ගේ ගමන යන්නට හදනව. මේ පිරිස් සමග ඔය කියන අරමුණු කරා යන්න පුළුවන් ද?**

**පිළිතුර:-** රජයේ විවිධ කණ්ඩායම් හා පක්ෂ තිබෙනව. අදහස් රාශියකුත් තිබෙනව. අපි මුලින්ම යහපත් රාජ්‍ය පාලනයක් පිළිබඳ ආදර්ශයක් පුළුල් කළ යුතුයි. ජනාධිපතිතුමා යුද්ධය ජය ගත්තා. දැන් සාමය හා සංවර්ධනය වෙනුවෙන් අලුත් යුද්ධයක් ආරම්භ වෙලා තිබෙනව. ඒ නිසා පත්වන අලුත් පාර්ලිමේන්තුව සාමය හා සංවර්ධනය පිළිබඳ අලුත් සන්ධානයක් ලෙස හඳුන්වා දෙන්න පුළුවනි. ජනාධිපතිතුමා සමග අත්වැල් බැඳගෙන මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය



අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ඇමැති
මිලින්ද මොරගොඩ

හරියට ක්‍රියාවට නැංවුවහොත් මේ ප්‍රශ්න සෑහෙන දුරට විසඳා ගන්නට පුළුවනි.

**ප්‍රශ්නය:- අද දේශපාලනඥයන්ට සමාජයේ තිබෙන පිළිගැනීම ඉතාමත් අඩු වෙලා. පිළිගැනීම වෙනුවට ඔවුනට එල්ල වන්නේ චෝදනා. අල්ලස, දූෂණය, කුඩු, මත්ද්‍රව්‍ය ආදී විවිධ චෝදනා මොවුනට නැගෙනව. ඇයි මේවා වළක්වන්නට ඉහළින් පියවර නොගන්නේ?**

**පිළිතුර:-** ඔබ කියන කතාව හරි. දේශපාලනඥයන්ට රටේ තිබූ පිළිගැනීම තුරන් වෙමින් තිබෙනව. විවිධ හේතු හා වැරදි ඒවට බලපාල ඇති. ජනතාව මේ දේශපාලනඥයන් හොඳින් දන්න අඳුනන නිසා ඡන්දය දෙන කොට තමන්ට ගරු කරන්න පුළුවන් අය පත් කර ගැනීමයි වැදගත්. අද තිබෙන සමහර වාර්තා බැලුවම ජේනව ආරක්ෂක අංශ කුඩු විකුණන මිනිහව අල්ල ගන්නව. නමුත් කුඩු තොග පිටින් රටට ගේන මිනිහව අල්ල ගන්නෙ නැහැ. ඒකයි මම කියන්නෙ මේ රටේ දේශපාලනයට වැඩිපුර කාන්තාවන් ගේන්න කියල. මව් ගුණය තිබෙන කාන්තාවො ඔය මත්ද්‍රව්‍ය වැනි වැරදිවලට තදින්ම විරුද්ධයි. දැන් කොළඹ දිස්ත්‍රික්කය ගත්තත් මත්ද්‍රව්‍ය වැරදිවලට වසරකට චෝදනා ලබන ගණන දාහත් දාහක් විතර වෙනව. මේ අයගෙන් කාන්තාවො ඉන්නෙ 552 යි. එයින්ම ජේනව ඉතාමත් අල්ප පිරිසක් තමයි කාන්තාවන් අතරත් මෙබඳු බරපතළ වැරදි කරන්නෙ. පසුගිය ජනාධිපතිවරණයේ දී ජනාධිපතිතුමා දිනවන්න පෙරමුණ ගත්තෙ කාන්තාවො. එදා උදේ ඉඳල ඡන්ද පෝලිම්වල පෙරමුණ ගත්තෙ කාන්තා පක්ෂය. මතට තිත වගේ සංකල්පවලට එයාල ගරු කරනවා. ඒ නිසා අපි කාන්තා නියෝජනය ගැන කාන්තා ප්‍රශ්න ගැන මීට වඩා අවධානය යොමු කළ යුතු බවයි මගේ අදහස.

**ප්‍රශ්නය:- ඔබ කැබිනට් අමාත්‍යවරයකු ලෙස වර්ෂ 10ක් පමණ කටයුතු කර තිබෙනව. රටේ ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය යුගයක් මේ. පවත්නා ලෝක තත්ත්වය අනුව අපට සංවර්ධනය කළ හැකි ක්ෂේත්‍ර ගැන ඔබේ දැක්ම කුමක් ද?**

**පිළිතුර:-** මම කාලයක් සංචාරක ඇමැති හැටියටත් හිටිය. අපට ඉක්මණින්ම දියුණු කළ හැකි විෂයයක් තමයි සංචාරක ක්ෂේත්‍රය. යුද්ධය හමාර වීමෙන් පසුව ගිය මාසය පමණ වන කොට සංචාරක අංශය 48%කින් පමණ වර්ධනය වෙලා තිබෙනවා. මේ අංශය සෘජු රැකියා එක් ලක්ෂ විසිපන් දාහක් විතර තිබෙනව. ඒ අයගෙන් යැපෙන පවුල් හා වක්‍ර රැකියා කරන අයත් ගත්තම ලක්ෂ 10ක් විතර සංචාරක කර්මාන්තයෙන් යැපෙනව. ඒ නිසා මේ ක්ෂේත්‍රය ඉක්මනින් පුළුල් වන අංශයක් ලෙස අපට හඳුනා ගන්නට පුළුවනි.

**ප්‍රශ්නය:- ජනාධිපතිතුමා අපේක්ෂා කරනව 2016 වන විට මෙරට සංචාරකයන් ලක්ෂ 25ක් ගේන්න. ඒ ඉලක්කය කරා අපට යා හැකි ද?**

**පිළිතුර:-** බැරිකමක් නැහැ. එහෙම ගියොත් සංචාරක ක්ෂේත්‍රයේ සෘජු රැකියා 6,25,000ක් විතර ඇති වෙනව. නමුත් මේ සංචාරකයන් ලක්ෂ 25 සඳහා හෝටල් කාමර තවත් 36,000ක්වත් හදන්නට වුවමනා කරනව. මේ සඳහා ඩොලර් කෝටි 450ක් විතර ආයෝජනය කරන්නට සිද්ධ වෙනව. ඒ නිසා දැන්මම සැලසුම්සහගතව ඒ කටයුත්තට බහින්න ඕනෑ. අනිත් එක අපේ ආර්ථිකය විවෘත වෙන කොට රැකියා අවස්ථා ගොඩක් නිර්මාණය වෙනව. රක්ෂණ බැංකු වගේ. ඒවායේ කොමිස් පිට කෙරෙන වෘත්තීන්ට දැන් හොඳ ඉඩක් තියෙනව. සමහර රක්ෂණ නියෝජිතයන්ගෙ මාසික ආදායම රුපියල් ලක්ෂ 10 පනින අවස්ථා මම දන්නව. ඒ නිසා තරුණ සමාජයත් ඕව ගැන උනන්දු වෙන්න ඕනෑ.

**ප්‍රශ්නය:- ඔබ පෝස්ටර් හා කටවුට් වෙනුවෙන් වැය නොකරන මුදල් පොදුජන සේවා උදෙසා වැය කරන බව කීවා. මේ වන විට එසේ කර තිබෙන පොදු සේවා මොනවා ද?**

**පිළිතුර:-** මම මුලින්ම කොළඹ වජිරාරාම පොදු කටයුත්තකට ඒ මුදල්වලින් කොටසක් පිරිනැමුවා. කොළඹ හින්දු විද්‍යාලයේ දරුවන්ගේ පහසුකම් පුළුල් කරන්න තවත් මුදලක් පරිත්‍යාග කළා. නවගමුවෙ පන්සලට උදව් කළා. මුස්ලිම් ජනතාව වෙනුවෙනුත් තවත් තෝරාගත් ආගමික හා පොදු සේවා මධ්‍යස්ථානවලට මේ අරමුදල් පිරිනමනව. මේක ආදර්ශයක් දෙන්න කරන වැඩක්.

**ප්‍රශ්නය:- ඔබ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ විශේෂඥ දැනීමක් තිබෙන කෙනෙක්. යුද්ධයට පෙර වගේම යුද්ධයෙන් පසුත් මේ රටට එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඇමෙරිකාව යුරෝපා ප්‍රජාව වැනි බලවත් තැන්වලින් විවිධ බලපෑම් එල්ල වෙනවා. මේවා සමනය කරගන්නට කළ යුත්තේ මොනවා ද?**

**පිළිතුර:-** මේ සිද්ධිවලට පසුබිම හදන්නෙ ජාත්‍යන්තරයෙ ඉන්න අන්තවාදී කොටස්. ඒ අය කොටි සංවිධානයට හිතවත්ව හිටපු පිරිසක්. ඔවුන් බටහිර රටවල සිට අපේ රටට විරුද්ධව මතවාදයක් ගොඩ නගනවා. ඒ අය දැන් සූදානම් වෙන්නෙ අපේ වෙළෙඳාමට ගහන්නයි. ශ්‍රී ලංකාවෙ නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ ගන්න එපා කියල ලොකු මතයක් අන්තර්ජාලය හරහා ලොව පුරා ගෙනියනවා. මේ බලවේගවලට බලවත් රටවල් වගේම සංවිධානත් අහු වෙලා. ඒ නිසා අපි මේවා ගැන යථාර්ථය ලෝකයට කියන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

**ප්‍රශ්නය:- එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා මධ්‍යස්ථව ක්‍රියා කළ යුතු වුවත් ඔහු මේ රට ගැන උපදෙස් දීමට මණ්ඩලයක් පත් කිරීම ගැන රජය උදහස්ව සිටිනවා. මෙය රටේ අභ්‍යන්තර කටයුත්තකට අත පෙවීමක් නොවේ ද?**

**පිළිතුර:-** බෑන් කී මූන් මහතාට ඔය කොටි හිතවාදී දෙමළ ප්‍රජාවෙන් මෙන්ම අනෙක් බලවත් ආණ්ඩුවලිනුත් පීඩනයක් එල්ල වෙනවා ඇති. ඒ නිසයි ඔය කොමිටි කතාව එන්න ඇත්තෙ. ඒකෙන් ප්‍රයෝජනයක් නැහැ. දැන් අපේ ජනාධිපතිතුමන් යුද්ධ කාලෙ ප්‍රශ්න ගැන හොයන්න කොමිටියක් පත් කළානේ. ඉතින් ඒකෙන් අපට අපේ ප්‍රශ්න ගැන විමර්ශනයක් කරගන්නට පුළුවනි. ඒ රටවල් මොනව කීවත් අපේ කටයුත්ත හරියට කරන්න ඕනෑ. ආරවුලක් අවශ්‍ය නැහැ. මොකද මේ ගෝලීය ආර්ථික ක්‍රමය අනුව ජාත්‍යන්තරයෙන් උදව් පදව් ඕනෑනේ.

**ප්‍රශ්නය:- එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා මේ කමිටුව පත් කරන්නේ අනාගතයේ ආරක්ෂක මණ්ඩලයට වාර්තා කොට අප රටට හිරිහැර කිරීමට නොවේ ද?**

**පිළිතුර:-** අපි මේ කමිටුව පත් කිරීමට පැහැදිලිවම විරුද්ධ විය යුතුයි. රජය දැනටමත් ඒ විරෝධය ප්‍රකාශ කරල හමාරයි. නමුත් මහලේම්ට උපදෙස් දෙන කමිටුවක වාර්තා ආරක්ෂක මණ්ඩලයට යවන ක්‍රමයක් නැහැ. අපත් අපේ ප්‍රශ්න ගැන විමර්ශනයට හිටපු නීතිපතිගේ ප්‍රධානත්වයෙන් කොමිටියක් දාපු බව කියන්න ඕනෑ. නොබැඳි සමුළුවත් මේ ගැන විරෝධය පළ කරල තිබෙනව. ඒත් මේ ඡන්ද උණුසුමේ මේව ගැන ප්‍රතිචාර දක්වන්න අමාරුයි. මේ ප්‍රශ්නයේ මුල් සොයා අපි ඒවාට ප්‍රතිකර්ම කළ යුතුයි. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඒ සම්බන්ධව නිහඬව ඵලදායි වැඩ පිළිවෙළක් ගෙන යනව. ඒක ප්‍රයෝජනවත්.

**ප්‍රශ්නය:- මේ ප්‍රශ්න ගැන ඔබෙන් තානාපතිවරු ප්‍රශ්න කර නැත්ද?**

**පිළිතුර:-** නිල නොවන මට්ටමින් වගේම අධිකරණ ඇමැති හැටියටත් මගෙන් යම් යම් අවස්ථාවල ඔවුන් කරුණු විමසා තිබෙනව. මම මේ සියලු දෙනාට අපේ රාජ්‍ය ප්‍රතිපත්තිය පැහැදිලි කරල දෙනව. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව රටේ කිසිම ජන කොටසකට අසාධාරණයක් නොකරන බව විශ්වාසයි කියා මම ඔවුන්ට පැහැදිලි කළා.

සාකච්ඡාව:
**රන්ජිත් ආනන්ද ජයසිංහ**